2015, යල කන්නයේ වී වගා කළ බිම් ප්‍රමාණය හෙක්ටයාර 392,336 ක් පමණ වූ අතර, එමඟින් අපේක්ෂිත වී නිෂ්පාදනය මෙ.ටො. මිලියන 1.565 කි. මෙම වී නිෂ්පාදනයෙන් වී අලෙවි මණ්ඩලය විසින් මෙ.ටො. 120,000 මිලදී ගැනීමට සැලසුම් කර තිබුණ අතර, 2016 යල කන්නයේදී මිලදී ගත් මුළු වී ප්‍රමාණය මෙ.ටො.25,438 කි. අදාළ ප්‍රදේශවල කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර විසින් සහතික කරන ලද තොරතුරු වාර්තාව සමඟ ගොවීන් විසින් ඍජුවම ගබඩාවට වී ලබා දුන් අතර, වී අලෙවි මණ්ඩලය විසින් නිර්දේශ කර ඇති වී ප්‍රමාණය වන කි.ග්‍රෑ. 2,000 ක්වූ උපරිම සීමාවක් යටතේ එක් ගොවියෙකුගෙන් වී මිලදී ගැනීම සිදු කරන ලදී.

කෘෂි අලෙවි සංවර්ධන උපාය මාර්ගයක් ලෙස ග්‍රාමීය ප්‍රදේශවල නිෂ්පාදන අලෙවි කර ගැනීම සඳහා පහසුකම් සැපයීමේ අරමුණින් 1998 සිට රජයේ අයවැය ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම ආරම්භ කර ඇත.

වර්තමානයේ මෙම සියලුම ආර්ථික මධ්‍යස්ථාන සම්බන්ධීකරණය හා මෙහෙයවීම් කටයුතු මෙම අමාත්‍යාංශය යටතට පැවරී ඇත. දැනට ක්‍රියාත්මක මට්ටමේ පවතින ආර්ථික මධ්‍යස්ථාන සංඛ්‍යාව 13කි. අම්පාර හා කිලිනොච්චි දිස්ත්‍රික්කයන්හි විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන දෙකක් ඉදිකරමින් පවතී. විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ප්‍රධාන ප්‍රභේද තුනකින් සමන්විත වන අතර ඒවා කෘෂි නිෂ්පාදන ප්‍රදේශ කේන්ද්‍ර කරගත් තොග මධ්‍යස්ථාන, කෘෂි නිෂ්පාදන හා අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය තොග/ සිල්ලර වශයෙන් බෙදාහැරීමේ මධ්‍යස්ථාන,නාගරික ප්‍රදේශ කේන්ද්‍ර කරගත් සිල්ලර අලෙවි මධ්‍යස්ථාන වශයෙන් බෙදී ඇත. 2016 වසරේ අයවැය ප්‍රතිපාදන මඟින් ලද රුපියල් මිලියන 50 න් හා කළමනාකරණ භාර අරමුදල් වලින් රුපියල් මිලියන 08ක් වැය කර මෙම වසර තුළ ආර්ථික මධ්‍යස්ථානයන්හි යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සිදු කර ඇත. තවද සියළුම ආර්ථික මධ්‍යස්ථානයන් හි කළමනාකරණ භාර සභාපතිත්වයට ඒවා පිහිටි දිස්ත්‍රික්කයන් හි දිස්ත්‍රික් ලේකම් වරුන් පත් කරමින් හා කාර්යය පරිපාටි සංග්‍රහයක් හඳුන්වා දීම මඟින් මෙහි පරිපාලන කටයුතු විධිමත් කිරීමට කටයුතු කර ඇත.

මේ අනුව ප්‍රධාන විෂයය ක්ෂේත්‍ර 4 ක් යටතේ ක්‍රියාත්මක වන මෙම අමාත්‍යාංශයේ කාර්යයභාරය 2016 වසර තුළ මනා මුල්‍ය කළමනාකාරීත්වයකින් යුතුව විධිමත්ව ඉටු කිරීමට හැකි වී ඇත.

# 9. අමාත්‍යාංශය මගින් 2016 වසර තුළ ඉටුකල වැඩසටහන්

## 9.1. දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීමේ වැඩසටහන

### 9.1.1. කුඩා පරිමාණ කිරි ගොවීන් නිෂ්පාදනය කරන කිරි වල ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය

කිරි ගොවිපොළවල නිෂ්පාදිත කිරිවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම අරමුණින් දිස්ත්‍රික් මට්ටමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. මෙමගින් ගොවීන්ට ඔවුන්ගේ නිෂ්පාදිත කිරි සඳහා ඉහළ මිලක් හිමිවන අතර, කිරි ගොවීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම ද සිදුවේ.

තෝරා ගනු ලබන ප්‍රතිලාභීන් සඳහා සියයට 50 ක රජයේ දායකත්වයක් යටතේ රුපියල් 60,000ක උපරිමයකට යටත්ව ආධාර මුදලක් ලබා දෙන අතර, එම මුදලින් කිරි දෙවීමේ යන්ත්‍ර ලබා දීම, තෘණ සංවර්ධනයට අවශ්‍ය පහසුකම් සැලසීම, උසස් ආරයේ කිරි ගවයකු ලබා දීම වැනි මැදිහත්වීම් සිදුවේ. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු හරහා ක්‍රියාත්මක වන මෙම වැඩසටහන මගින් එක් දිස්ත්‍රික්කයකින් ප්‍රතිලාභීන් 20 දෙනෙකු බැගින් දිවයින පුරා ප්‍රතිලාභීන් 500ක් සඳහා ප්‍රතිලාභ ලබා දේ. මෙම වසර තුළදී ව්‍යාපෘති 315 ක වැඩ නිම කර ඇති අතර, ඒ සඳහා රු.මිලියන 15.86 ක මුදලක් වැය කර ඇත.

### 9.1.2. කාන්තා සවිබල ගැන්වීම තුළින් කුඩා පරිමාණ කිරි සැකසුම්කරුවන්ගේ කිරි නිෂ්පාදනවල තත්ත්වය ඉහළ නැංවීම

දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය මගින් කිරි ලීටර් 20 කට නොඅඩු දෛනික කිරි සැකසුමක් පවතින කාන්තා ව්‍යවසායික කිරි සැකසුම්කරුවන්ගේ කිරි නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම බලාපොරොත්තු වන අතර, නිෂ්පාදිත සඳහා ඉහළ මිලක් ලැබීමෙන් කාන්තාවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම ද සිදුවේ.

තෝරා ගනු ලබන ප්‍රතිලාභීන් සඳහා සියයට 50 ක රජයේ දායකත්වයක් යටතේ රුපියල් 50,000 ක උපරිමයකට යටත්ව ආධාර මුදලක් ලබා දෙන අතර, කිරි ආශ්‍රිත නිෂ්පාදන වල ගුණාත්මක භාවය ඉහළ නැංවීමේ අරමුණින් සුදුසු මැදිහත්වීමක් සිදුකරනු ලබන අතර, මේදය ඉවත් කිරීමේ යන්ත්‍ර, අධිශීතකරණ හා බෝතල් ශීතකරණ ආදිය ලබා දීම සිදු කරයි. එක් දිස්ත්‍රික්කයකින්

ප්‍රතිලාභීන් 10ක් තෝරා ගනු ලබන අතර, දිවයින පුරා ප්‍රතිලාභීන් 250ක් සඳහා මේ යටතේ ප්‍රතිලාභ හිමිවේ. මෙම වර්ෂය තුළදී ව්‍යාපෘතින් 76 ක වැඩ නිම කර ඇති අතර, ඒ සඳහා රු.මිලියන 2.32ක මුදලක් වැය කර ඇත.

### 9.1.3. දියර කිරි භාවිතය සහ දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම සම්බන්ධයෙන් පාසැල් සිසුන් සඳහා දීපව්‍යාප්ත නිර්මාණ තරඟාවලියක් සංවිධානය කිරීම

පාසැල් සිසුන් අතර දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීමේ අරමුණින් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව ජාතික වැඩසටහනක් ලෙස දීපව්‍යාප්තව ක්‍රියාත්මක කරන ලදී.

"දියර කිරි පරිභෝජනය"යන තේමාව යටතේ සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් රචනා, කාව්‍ය නිර්මාණ, රූපවාහිනී අත් පිටපත්, දියර කිරි නිෂ්පාදනය පිළිබඳ ලාංඡන සහ චිත්‍ර නිර්මාණ යන තරඟ ඉසව් 14ක් යටතේ තරඟ පවත්වන ලද අතර, අදාළ ඇගයීම් කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නම් කරන ලද විනිශ්චය මණ්ඩලයක් මඟින් සිදුකරන ලදී. ජයග්‍රාහී සිසු සිසුවියන් වෙත ත්‍යාග හා සහතිකපත් ප්‍රදානෝත්සවය 2016 ජුනි 15 වන දින අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී උත්කර්ෂවත් ලෙස පවත්වන ලදී.






*ත්‍යාග සහ සහතික පත්‍ර ප්‍රදානෝත්සවයේ අවස්ථාවන්*

## 9.2. අභිජනන ගොවිපොළ පිහිටුවීමේ වැඩසටහන

### 9.2.1. අභිජනන ගොවිපොළ පිහිටුවීම

දේශීය කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය උසස් ආරයේ කිරි දෙනුන්ගේ හිඟකම මගහරවා ගැනීමේ අරමුණ ඇතිව දිවයින පුරා පළාත් මට්ටමින් අභිජනන ගොවිපොළවල් පිහිටුවීම සිදු කරන ලදී. ඒ අනුව 2016 වසර තුළ සත්ත්ව අභිජනන ගොවිපොළ 210 ක් පිහිටුවා ඇත. එමගින් අභිජනනය සඳහා සුදුසු සතුන් මිලදී ගැනීම සහ ගවගාල් සාදා දීම සිදු කළ අතර, ඒ වෙනුවෙන් රු.මිලියන 20.586 ක මුදලක් වැය කර ඇත.

***2016** වසර තුළ ක්‍රියාත්මක අභිජනන ගොවිපොළ සංඛ්‍යාව*

| පළාත | අභිජනන ගොවිපොළ | |
|---|---|---|
| | ඉලක්කය | අනුමත කරන ලද සංඛ්‍යාව |
| මධ්‍යම | 40 | 40 |
| නැගෙනහිර | 15 | 07 |
| උතුර | 35 | 36 |
| උතුරු මැද | 20 | 21 |
| වයඹ | 40 | 43 |
| සබරගමුව | 10 | 09 |
| දකුණ | 10 | 10 |
| ඌව | 30 | 30 |
| බස්නාහිර | 20 | 23 |
| එකතුව | **220** | **219** |






*ස්ථාපනය කරන ලද අභිජනන ගොවිපොළ*

### 9.2.2. මධ්‍ය පරිමාණ අභිජනන ගොවිපොළ පිහිටුවීම

මෙම මධ්‍ය පරිමාණ අභිජනන ගොවිපොළ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් රිදියගම ගොවිපළෙහි ස්ථාපනය කරනු ලැබේ. ඕස්ට්‍රේලියාවෙන් ආනයනය කළ එම ගොවිපොළෙහි දැනට ඇති දැඩි කරනු ලබන මවු දෙනුන්ගෙන් ඉපදෙන පළමු පරම්පරාවේ වැස්සි පැටවුන් ඇති දැඩි කිරීම සඳහා මෙම ගොවිපොළ යොදා ගැනේ. එම පළමු පරම්පරාවේ සතුන්ගෙන් ජනිත වන දෙවන පරම්පරාවේ වැස්සි පැටවුන් කිරි ගොවීන් අතර බෙදා දීම මෙහි මූලික ඉලක්කය වේ. මේ සඳහා එක් ගොවිපොළකට රු. මිලියන 12 කට ආසන්න මුදලක් වැය කර ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් පැටවුන් සඳහා ගාල් 3ක් රිදියගම, මහබේරියතැන්න සහ නාරංගල්ල ගොවිපොළ තුනෙහි ඉදිකරන අතර, එයට වැයවන මුදලින් 50% ක දායකත්වය යටතේ ප්‍රතිපූර්ණයක් ලෙස රු. මිලියන 5 බැගින් රිදියගම හා මහබේරියතැන්න ගොවිපොළ වලටත් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින්, මිලියන 2.27 මුදලක් නාරංගල්ල ගොවිපොළ වෙතත් ලබා දෙන ලදී.



*ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් රිදියගම ගොවිපොළෙහි සිටින වැස්සි පැටවුන්*



**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් රිදියගම ගොවිපොළෙහි දැනට ඉදිකරමින් පවතින වැස්සි පැටවු ගාල**

### 9.2.3. කුඩා පරිමාණ කිරි ගොවීන් දිරිගැන්වීම

කිරි ගවයින් ඇති කිරීමට උනන්දුව හා හැකියාව ඇති, ක්ෂේත්‍රයට අලුතින් එක් වන ගොවි මහතුන් මෙන්ම දැනට කුඩා පරිමාණ කිරි නිෂ්පාදකයන්ගේ ආදායම් ප්‍රමාණය වැඩි කර ගැනීම සඳහා, වට්නාකමින් සියයට 50 ක දායකත්වය යටතේ දෙනුන් හෝ වැස්සියන් ලබා දීම මෙම වැඩසටහනේ අරමුණයි. මෙම වසරේ ඉලක්කගත ප්‍රතිලාභී ගොවීන් සංඛ්‍යාව 100ක් වන අතර, වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 3කි. වසර අවසාන වන විට ව්‍යාපෘති 76 ක් නිම කර රු.මිලියන 2.265 ක් වැය කර ඇත.

### 9.2.4. තෘණ වගා ව්‍යාපෘතිය

උසස් වර්ගයේ තෘණ සත්ත්ව ආහාර ලෙස භාවිත කිරීම හා වාණිජ තෘණ සැපයුම්කරුවන් ලෙස ගොවීන් දිරිමත් කිරීම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය යටතේ, තෘණ කැපීම/කැබලි කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා තෘණ සංරක්ෂණය කිරීමට අවශ්‍ය උපකරණ ප්‍රතිලාභීන් වෙත ලබා දීම සිදුකෙරේ. එක් ගොවිපළක් සඳහා රුපියල් 100,000ක උපරිම සීමාවකට යටත් මුදලක් දායකත්වය ලෙස ලබා දේ. ප්‍රතිලාභීන්18 ක් සඳහා රුපියල් මිලියන 4 ක් වෙන් කර ඇත. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රතිලාභීන් 7 ක් සඳහා රු.මිලියන 0.5 ක මුදල් වට්නාකමකින් යුත් යන්ත්‍රෝපකරණ හා අවශ්‍ය උපකරණ ලබාදී ඇත.



ප්‍රතිලාභීන් වෙත ලබා දුන් තෘණ කැබලි කරන යන්ත්‍ර

## 9.3. පශු සම්පත් සංවර්ධන මධ්‍යකාලීන වැඩසටහන

පශු සම්පත් ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා උතුරු පළාතෙහි පවතින විශාල විභවය තුළ පශු වෛද්‍ය කාර්යාල හා අනෙකුත් යටිතල පහසුකම් ස්ථාපනය කිරීම මඟින් පශු සම්පත් ක්ෂේත්‍රයේ සේවා සැපයුම වැඩි දියුණු කිරීම සඳහා කටයුතු කර ඇත. ව්‍යාපෘතිය මඟින් මෙම වසර තුළ සිදු කරන ලද ක්‍රියාකාරම් පහත දැක්වේ.

| | ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| 1 | කිලිනොච්චි සත්ත්ව පාලන පුහුණු පාසලෙහි පිරිමි නේවාසිකාගාරය ඉදි කිරීම | 100% |
| 2 | පලෛ පශු වෛද්‍ය නිල නිවාස ඉදි කිරීම | 100% |
| 3 | මන්නාරම, මාන්තෙයි (බටහිර) පශු වෛද්‍ය නිල නිවාස ඉදි කිරීම | 80% |
| 4 | කිලිනොච්චි සත්ත්ව පාලන පුහුණු පාසලෙහි සම්පත් දායකයින් සඳහා නිල නිවාස දෙකක් ඉදි කිරීම | 80% |
| 5 | මුලතිවු මාන්කුලම් පශු වෛද්‍ය නිල නිවාසය ඉදිකිරීම | 80% |
| 6 | ඩෙල්ෆ් පශු වෛද්‍ය කාර්යාලයේ වැට ඉදි කිරීම | 100% |
| 7 | මුලතිවු දිස්ත්‍රික්කයේ වැලි ඔය පශු වෛද්‍ය කාර්යාලයේ වැට ඉදි කිරීම | 100% |
| 8 | වවුනියාව ද්විත්ව නිල නිවාසයේ අලුත්වැඩියා කටයුතු | 100% |
| 9 | උතුරු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත කාර්යාලීය උපකරණ ලබා දීම. | 100% |
| | UPS Machines 08 | |
| | Desktop Computers 08 | |
| | Laser Printers 03 | |
| | Photocopy Machines 01 | |



කිලිනොච්චි සත්ත්ව පාලන පුහුණු පාසලෙහි පිරිමි ශිෂ්‍ය නේවාසිකාගාරය



පලෛහි පශු වෛද්‍ය නිල නිවාස

## 9.4 . කිරි ගවයින් ආනයන වැඩසටහන

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කිරි ගව අභිජනන සංචිතය  දියුණු කිරීම සහ උසස් ආරයේ කිරි ගවයින් ගොවීන් වෙත සපයාදීම අරමුණු කරගෙන කිරි ගවයින් 4,500ක් කණ්ඩායම් ලෙස ආනයනය කිරීමට කටයුතු කර ඇත. 2012 සහ 2013 වර්ෂ වලදී ගැබ් ගත් දෙනුන් 2,000 ක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් බෝපත්තලාව, මැණික්පාලම හා ඩයගම යන ගොවිපොළවල් සඳහා ආනයනය කර ඇත. ආනයනය කළ එළදෙනුන්ගේ කාර්යක්ෂමතාවය වැඩි කිරීමටත් සත්ත්ව අපද්‍රව්‍ය පහසුවෙන් ඉවත් කිරීමටත් පහසුවන පරිදි සාම්ප්‍රදායික ගවගාල් නවීකරණය කරන ලදී.

2016 වර්ෂයේදී ඉතිරි කිරි ගවයින් 2,489ක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් රිදියගම ගොවිපොළ වෙත ආනයනය කර ඇති අතර, එම සතුන්ට ආහාර සැපයීම සඳහා භූමිය සංවර්ධනය කර තෘණ වගා කර ඇති අතර, අවශ්‍ය කෘත්‍රිම පාරිසරික තත්ත්ව වලින් සහ සත්ත්ව අපද්‍රව්‍ය ඉවත් කරන කාර්යක්ෂම ක්‍රම වලින් සමන්විතව නවීන  ගවගාල් ඉදි කර ඇත. 2016 වර්ෂය තුළදී මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් වී තිබූ  ප්‍රතිපාදන යොදා ගනිමින් ව්‍යාපෘතියේ ඉතිරි ගෙවීම් කටයුතු සිදු කළ අතර, ආනයනය කරන ලද සතුන්ට සාන්ද්‍ර ආහාර  ලබාදීම හා කාර්යය මණ්ඩලය සඳහා නිල නිවාස ඉදිකිරීම සිදුකරන ලදී.

බෝපත්තලාව, මැණික්පාලම, ඩයගම යන ගොවිපොළවල් තුළ 2012 ජුලි සිට 2016 දෙසැම්බර් දක්වා  නිෂ්පාදනය කර ඇති මුළු කිරි ප්‍රමාණය ලීටර් මිලියන 30.79 ක් වන අතර, රිදියගම ගොවිපළ තුළ 2016 අගෝස්තු සිට  2016 දෙසැම්බර් මාසය දක්වා නිෂ්පාදනය කරන ලද මුළු කිරි ප්‍රමාණය  ලීටර් මිලියන 9.4 කි.  මෙම ගොවිපොළ වල වර්තමාන කිරි ලීටරයක විකුණුම් මිල රුපියල් 85.00 සිට රුපියල් 87.00 අතර අගයක් වේ.

බෝපත්තලාව, මැණික්පාලම, ඩයගම යන ගොවිපළ වෙත ආනයනය කරන ලද කිරි දෙනුන්ගෙන් බිහිවූ උසස් ආරයේ වැස්සි පැටවුන් 1,054 ක් හා වසු පැටවුන් 2,281 ක් ගොවීන් වෙත නිකුත් කර ඇත.  රිදියගම ගොවිපොළ වෙත ආනයනය කරන ලද කිරි ගවයින්ගෙන් ලැබුණු වැස්සි පැටවුන් 363 ක් හා වසු පැටවුන් 900 ක් මණ්ඩලයේ අනෙකුත් ගොවිපොළවල් වෙත නිකුත් කර ඇත. බෝපත්තලාව, මැණික්පාලම, ඩයගම හා රිදියගම ගොවිපොළවල්හි ඉදිරි පරම්පරාව සඳහා ගැහැණු සතුන් 1,450 ක්  හා පිරිමි සතුන් 256 ක් ඇති දැඩි කරනු ලැබේ.

## 9.5 . සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ සංවර්ධන වැඩසටහන

කුකුළු නිෂ්පාදනයෙන් රට ස්වයංපෝෂිත කර අපනයන වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් කටයුතු කිරීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. මේ යටතේ නව ව්‍යවසායකයින් කුකුළු පාලන ක්ෂේත්‍රය සඳහා යොමු කිරීමත්, දැනට සිටින ව්‍යවසායකයින් දිරිමත් කිරීමත් සිදු කරන අතර බිත්තර, කුකුළු මස් හා සත්ත්ව ආහාර නිෂ්පාදනය මෙන්ම කුකුළු පැටවුන් නිෂ්පාදනය ප්‍රචලිත කිරීමත් අපේක්ෂා කෙරේ. සෑම පුද්ගලයෙකුටම සතියකට බිත්තර 3 ක් සහ වසරකට කුකුළු මස් කිලෝ ග්‍රෑම් 10 ක් පරිභෝජනය කිරීමට හැකිවන පරිදි කුකුළු මස් හා බිත්තර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

2016 වසර තුළදී සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළ 1,500ක් ස්ථාපනය කිරීමට ඉලක්ක කරන ලද අතර, වසර අවසාන වන විට කුඩා පරිමාණ ගොවිපොළ 1,595ක් පිහිටුවා ඇත.

තවද, මෙම වසර තුළ කුඩා පරිමාණ සත්ත්ව ආහාර නිෂ්පාදනාගාර 18 ක් ස්ථාපනය කර ඇති අතර, කුඩා පරිමාණ මස් සකස් කිරීමේ මධ්‍යස්ථාන 17 ක් ස්ථාපනය කිරීමේ කටයුතු අවසන් කර ඇත. මීට අමතරව මෙම වසර තුළදී ප්‍රතිලාභීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් 09 ක් ක්‍රියාත්මක කරන ලදී. වසර අවසාන වන විට ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 13.37 ක මුදලක් වැය කර ඇත.

## 9.6 . ශ්‍රී ලංකාවේ සූකර කර්මාන්තය සංවර්ධන වැඩසටහන

සූකර කර්මාන්තයේ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් හොරකැලේ ගොවිපොළෙහි න්‍යෂ්ටික සූකර පට්ටියක් ස්ථාපිත කිරීම සඳහා නුමුහුන් ඊරියන් සහ ඌරන් ආනයනය කිරීම 2016 වසරේ සිදුකරන ලදී. සතුන්ගේ ආරය උසස් කිරීමේ අරමුණින් අභිජනනය සඳහා එම ආනයනික සතුන්ගෙන් ලබාගන්නා පැටවුන් ගොවීන්ට නිකුත් කිරීම මෙම වැඩසටහන මගින් සිදුවේ. තවද, මෙම ව්‍යාපෘතිය තුළින් බස්නාහිර පළාත් කොටදෙණියාව සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයේ පවත්වාගෙන යනු ලබන කෘත්‍රිම සිංචන කටයුතු ව්‍යාප්ත කිරීම සිදුකෙරේ.

මෙම වැඩසටහන යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ න්‍යෂ්ටික සූකර ගොවිපොළට අනුබද්ධව මාටින් ගොවිපොළේ නවීන පන්නයේ සූකර නිවාසයක් ඉදි කිරීම අවසන් කර ඇති අතර, මේ සඳහා රුපියල් මිලියන 3.5ක් ආයෝජනය කරන ලදී. බස්නාහිර, වයඹ, සබරගමුව, හා නැගෙනහිර පළාත් තුළ දැනට පවතින කුඩා පරිමාණ සූකර ගොවිපොළ 73 ක් පරිසර හිතකාමී තත්ත්වයට නඟා සිටුවා ඇත.

මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මෙහෙයවීම යටතේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශු වෛද්‍ය පීඨයට අනුබද්ධව ආදර්ශ පුහුණු සූකර ගොවිපොළක් ස්ථාපනය කිරීම සඳහා රුපියල් මිලියන 2 ක් ආයෝජනය කර ඇති අතර, එමඟින් මධ්‍යම පළාතේ සූකර ගොවීන් හා ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීම සහ පශු වෛද්‍ය පීඨයේ ඉගෙනුම ලබන උපාධි අපේක්ෂකයින් සඳහා අවශ්‍ය සූකර පාලනය පිළිබඳ පුහුණුව ලබාදීමටද හැකිවනු ඇත.

මීට අමතරව, සූකර සංවර්ධන වැඩසටහන යටතේ බස්නාහිර හා වයඹ පළාත්වල ප්‍රතිලාභීන් හා නිලධාරීන් දැනුවත් කිරීම සහ ගැටලු හඳුනාගැනීමේ වැඩමුළු සාර්ථකව නිම කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා මෙම වසරේ රු.මිලියන 9.35 ක මුදලක් වැය කර ඇත.

## 9.7. බඩල්ගම නව කිරි සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම

මිල්කෝ සමාගමට අයත් කොළඹ නාරාහේන්පිට පිහිටි කිරි සැකසුම් කර්මාන්ත ශාලාව බඩල්ගම පිහිටි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් සිරිංගපාත ගොවිපොළෙහි ස්ථාපනය කිරීමට තීරණය කරන ලදී. මෙම ව්‍යාපෘතිය ඩෙන්මාර්ක් රජයේ සහයෝගීතාව මත ක්‍රියාත්මක වන අතර, එහි පළමු අදියර යටතේ කර්මාන්ත ශාලාව ඉදි කිරීම සඳහා 2016.05.18 දින මුල්ගල තැබීම සිදුකරන ලද අතර, මේවන විට මූලික ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතී. මේ සඳහා දේශීය අරමුදලින් රුපියල් මිලියන 10 ක් ලබා දී ඇත. කර්මාන්ත ශාලාව ඉදිකිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ කොටස් සහ ඉදිකිරීම් ද්‍රව්‍ය බහාලුම් 08 ක් සමාලෝචිත කාලසීමාව තුළ ආනයනය කර ඇත.

## 9.8. දැනුම වර්ධනය කිරීම තුළින් කිරි නිෂ්පාදනය සඳහා ව්‍යාප්ති සේවා සවිබල ගැන්වීම

මෙම ව්‍යාපෘතිය යටතේ බෙලරුස් රාජ්‍යයේ කෘෂිකර්ම විශ්ව විද්‍යාලයෙහි කිරි ගව පාලනය සම්බන්ධයෙන් සති 06ක පුහුණුවක් සඳහා නිලධාරීන් දස දෙනෙකුට අවස්ථාව සැලසී ඇත. ශ්‍රී ලංකා සහ බෙලරුස් රාජ්‍යයන් අතර සහයෝගීතාව සඳහා වන එකඟතා ගිවිසුම් කෙටුම්පත නෛතික නිරීක්ෂණ ක්‍රියාවලියට ඉදිරිපත්ව ඇත.

## 9.9. අපනයන කෘෂි කර්මාන්තය හා කිරිගව පාලනය ප්‍රවර්ධනය කිරීම තුළින් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය (කුරුණෑගල හා ගම්පහ දිස්ත්‍රික්ක )

කිරි කර්මාන්තය වැඩිදියුණු කිරීම අරමුණින් කුරුණෑගල සහ ගම්පහ දිස්ත්‍රික්ක දෙකෙහි ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය සඳහා ආයෝජිත ප්‍රතිපාදනය රුපියල් මිලියන 10 ක් වන අතර වසර අවසාන වන විට රු.මිලියන 6.5 ක මුදලක් වැය කර ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ එක් එක් දිස්ත්‍රික්කයන් සඳහා පහත වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

### 9.9.1. සමූහ කිරි ගොවි කණ්ඩායම් සෑදීම

තෝරාගත් ප්‍රතිලාභීන් 80 ක් සඳහා උසස් ආරයේ කිරි ගවයින් ලබා දීම, තෘණ වගා කිරීම සඳහා ආධාර ලබාදීම, කිරි නිෂ්පාදනය සඳහා අවශ්‍ය උපකරණ ලබාදීම සහ තෘණ කැබලිකිරීමේ යන්ත්‍ර ලබාදීම සියයට 50 ක රජයේ දායකත්වය රුපියල් 60,000 ක උපරිමයකට යටත්ව ලබාදීම සිදු කෙරේ. මෙම වර්ෂය තුළදී කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් ව්‍යාපෘති 80 ක හා ගම්පහ දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති 35ක වැඩ අවසන් කර ඇත.

### 9.9.2. කුඩා පරිමාණ කිරි සැකසුම් මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම

තෝරාගත් ප්‍රතිලාභීන් 4 ක් සඳහා සියයට 50ක රජයේ දායකත්වය රුපියල් 50,000 ක උපරිමයකට යටත්ව අවශ්‍ය කිරි සැකසුම් උපකරණ ලබා දීම සිදුකෙරේ. මෙම වර්ෂය තුළදී කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ව්‍යාපෘති 02ක් අවසන් කර ඇත.

## 9.10. ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන

### 9.10.1. කුඩා පරිමාණ කිරි ගොවිපළ සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහනෙහි ප්‍රතිපාදන යටතේ කුඩා පරිමාණ කිරි ගොවිපළවල ගුණාත්මක කිරි නිෂ්පාදනය දිරි ගැන්වීම අරමුණු කොටගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. එක් ප්‍රතිලාභියෙකු වෙත රුපියල් 60,000ක උපරිමයකට යටත්ව සියයට 50ක සහනාධාර මුදලක් මේ යටතේ නිකුත් කෙරේ. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු සහ මිල්කෝ (පුද්ගලික) සමාගම හරහා ක්‍රියාත්මක කරන මෙම ව්‍යාපෘතිය යටතේ 2016 වර්ෂයේ ව්‍යාපෘතීන් 524 ක වැඩ අවසන් කර ඇත.

### 9.10.2. කුඩා පරිමාණ එළු ගොවිපොළ සංවර්ධන වැඩසටහන

කුඩා පරිමාණ එළු පාලනයේ නියුතු ප්‍රතිලාභීන්ගේ ආර්ථිකය නඟා සිටුවීම හා දේශීය එළු කිරි හා එළු මස් නිෂ්පාදනය ඉහළ නංවා ජනතාවගේ පෝෂණ මට්ටම වැඩි දියුණු කිරීම ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය යටතේ, ගොවිපොළවල් 330 ක් පිහිටුවීම සඳහා රුපියල් මිලියන 20 ක් ආයෝජනය කර ඇත. මෙහිදී එක් ප්‍රතිලාභියෙකු වෙනුවෙන් පිරිමි සතෙකු හා ගැහැණු සතුන් 04 දෙනෙකු මිලට ගැනීම සඳහා රු.60,000 ක මුදලක් ලබා දේ. වසර අවසන් වන විට මේ යටතේ ව්‍යාපෘති 265ක් අවසන් කර ඇති අතර, ඒ සඳහා රු.මිලියන 15.85ක මුදලක් වැය කර ඇත.

### 9.10.3. කුඩා පරිමාණ කුකුළු ගොවිපළ සංවර්ධනය කිරීමේ වැඩසටහන

කුකුළු නිෂ්පාදන සඳහා ගෘහස්ථ මට්ටමේ දායකත්වය ලබාදීම තුළින් ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය යටතේ, එක් ප්‍රතිලාභියෙකු වෙත මසක් වයසැති කිකිළි පැටවුන් 10 බැගින් ලබාදීම ලබාදීම සිදුවේ.

මේ යටතේ සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළවල් 7,555 ක් දීපව්‍යාප්තව ස්ථාපනය කිරීමට නියමිත වූ අතර, වර්ෂ අවසාන වනවිට ගොවිපොළවල් 8681 ක් පිහිටුවා ඇත. මේ සඳහා රු. මිලියන 32.8 ක මුදලක් වැය කර ඇත.

### 9.10.4. බිත්තර නිෂ්පාදනය සඳහා මව් ආරයේ කිකිළි පැටවුන් ලබා ගැනීම (ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මඟින්)

මෙම ව්‍යාපෘතිය යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මඟින් වසර අවසාන වන විට මව් ආරයේ කිකිළි පැටවුන් 3360 ක් ආනයනය කර ඇත. ඒ සඳහා රු.මිලියන 3.178 ක මුදලක් වැය කර ඇත.

### 9.10.5. හොඳම කිරි ගොවියා / කිරි සැකසුම්කරු තේරීමේ තරඟය

පශු සම්පත් ක්ෂේත්‍රයේ නියැලෙන ගොවීන්/කිරි සැකැසුම්කරුවන් අතරින් හොඳම කිරි ගොවියා/හොඳම කිරි ආශ්‍රිත සැකැසුම්කරු තේරීමට මේ යටතේ පියවර ගෙන ඇත. ඒ අනුව අංශ 06 ක් යටතේ දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රාහකයින් 163 ක් සහ පළාත් මට්ටමේ ජයග්‍රාහකයන් 103 දෙනෙකු සඳහා වටිනා ත්‍යාග සහ සහතික පත් ප්‍රදානය කිරීම සිදුකර ඇති අතර, මේ වන විට ජාතික මට්ටමේ ජයග්‍රාහකයින් තෝරා ගැනීමේ කටයුතු අවසන් කර ඇත.

ව්‍යාපෘතිය යටතේ පවත්වන ලද තරඟ අංශ

| *හොඳම කිරි ගොවියා* | *හොඳම කිරි ආශ්‍රිත සැකසුම්කරු* |
|---|---|
| *1.සුළු පරිමාණ එළ ගව* | *5.සුළු පරිමාණ අංශය* |
| *2.සුළු පරිමාණ මී ගව* | *6.මධ්‍ය පරිමාණ අංශය* |
| *3.මධ්‍ය පරිමාණ එළ ගව* | |
| *4.මධ්‍ය පරිමාණ මී ගව* | |

❖ 2016 වර්ෂය තුළදී පශු සම්පත් සංවර්ධනය අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය

වැඩසටහන:02 - සංවර්ධන වැඩසටහන

ව්‍යාපෘතිය : 05- පශු සම්පත් සංවර්ධනය

| අනු අංකය | වැඩසටහන / ව්‍යාපෘතිය | 2016 අයවැය ප්‍රතිපාදන (රු.මි) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|
| 1 | දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම | 45.0 | 86 | 38.5 |
| 2 | අභිජනන ගොවිපොළ ස්ථාපනය කිරීම | 35.0 | 100 | 35.0 |
| 3 | පශු සම්පත් සංවර්ධන මධ්‍යකාලීන වැඩසටහන | 45.0 | 89 | 29.2 |
| 4 | කිරි ගවයින් ආනයනය | 900.0 | 100 | 565.39 |
| 5 | කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපොළවල් ඇති කිරිම | 15.0 | 89 | 13.37 |
| 6 | ශ්‍රී ලංකාවේ සූකර කර්මාන්තය නගා සිටුවීම | 10.0 | 93 | 9.35 |
| 7 | බඩල්ගම නව කිරි සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම | 10.0 | ** | - |
| 8 | දැනුම වර්ධනය කිරීම තුළින් කිරි නිෂ්පාදනය සඳහා වන ව්‍යාප්ති සේවා සවිබල ගැන්වීම | 4.0 | 15 | - |
| 9 | අපනයන කෘෂි කර්මාන්තය හා කිරිගව පාලනය ප්‍රවර්ධනය කිරීම තුළින් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය (කුරුණෑගල හා ගම්පහ දිස්ත්‍රික්ක ) | 10.0 | 69 | 6.5 |
| 10 | ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන | 110.0 | 100 | 110.0 |
| | එකතුව | **1,184.0** | | **807.3** |

❖ **අමාත්‍යාංශයේ සංවර්ධන හා සැලසුම් අංශය මගින් ඉටු කරන ලද කාර්යභාරය**

## 9.11. කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය

වාණිජමය වශයෙන් විභවයක් ඇති කිතුල් නිෂ්පාදන කර්මාන්තය සඳහා දේශීය හා විදේශීය වශයෙන් විශාල ඉල්ලුමක් පවතී. මෙම කර්මාන්තය සංවර්ධනය කිරීම මඟින් ග්‍රාමීය ජනතාවගේ ස්වයං රැකියා අවස්ථා වැඩිදියුණු කිරීම, කිතුල් කාර්මිකයින්ගේ හා ඒ ආශ්‍රිත ව්‍යවසායිකයන්ගේ ආදායම ඉහළ නැංවීම යන අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඉඩ ප්‍රස්තා සැලසේ.

කිතුල් කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා සිදුකරන ලද මැදිහත්වීම් පහත පරිදි වේ.

- ❖ මල් මදින්නන් පුහුණු කිරීම
- ❖ ආරක්ෂිත බඳපටි ලබාදීම
- ❖ මල් මැදීම සඳහා සුදුසු පිහි, උඳුන් සහ තාච්චි ලබාදීම
- ❖ කැස්පර් තාක්ෂණය හා සාම්ප්‍රදායික තාක්ෂණය හඳුන්වාදීම
- ❖ කිතුල් පැණි, හකුරු හා කිතුල් ආශ්‍රිත කර්මාන්තවල ප්‍රමිතිය වැඩිදියුණු කිරීම
- ❖ කිතුල් නිෂ්පාදකයින් ලියාපදිංචි කිරීම හා කිතුල් කාර්මිකයින් සඳහා හැඳුනුම්පත් ලබාදීම

2016 වසරේදී කිතුල් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා දේශීය අරමුදලින් රුපියල් මිලියන 30 ක ප්‍රතිපාදන ලබා දී ඇත. දිස්ත්‍රික්ක 12 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 56 ක ප්‍රතිලාභීන් 3,500 දෙනෙකු සඳහා පහත සඳහන් පරිදි කටයුතු කර ඇත.

| දිස්ත්‍රික්කය | ප්‍රතිලාභ ලබා දුන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වෙන් කළ මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|
| කළුතර | 04 | 223 | 1.70 | 1.63 |
| කෑගල්ල | 04 | 290 | 2.51 | 2.36 |
| ගාල්ල | 08 | 412 | 3.04 | 2.90 |
| බදුල්ල | 11 | 960 | 7.08 | 6.86 |
| මහනුවර | 07 | 445 | 3.31 | 3.15 |
| මාතර | 04 | 153 | 2.28 | 2.18 |
| මාතලේ | 03 | 131 | 1.16 | 1.12 |
| රත්නපුර | 08 | 618 | 4.53 | 4.51 |
| හම්බන්තොට | 02 | 65 | 1.49 | 1.38 |
| නුවරඑළිය | 03 | 107 | 1.76 | 1.73 |
| කුරුණෑගල | 01 | 71 | 0.70 | 0.67 |
| අම්පාර | 01 | 25 | 0.14 | 0.12 |
| **එකතුව** | **56** | **3500** | **29.70** | **28.61** |

## 9.12. සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීම

මෙම ව්‍යාපෘතිය සඳහා 2016 වර්ෂයට රුපියල් මිලියන 29 ක ප්‍රතිපාදන දේශීය අරමුදල මගින් ලබා දී ඇත. හස්ත කර්මාන්තකරුවන් ආර්ථිකමය වශයෙන් ශක්තිමත් කිරීම, පාරම්පරික කර්මාන්ත හා ශිල්පීය කුසලතා සඳහා නව තාක්ෂණික වටිනාකමක් ලබාදීම, හස්ත කර්මාන්තවල නියුක්ත වූවන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සහ හස්ත කර්මාන්ත නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ අවස්ථා පුළුල් කිරීම මේ තුළින් බලාපොරොත්තු විය.

මෙම ව්‍යාපෘතිය මගින් තාක්ෂණික උපකරණ සහ පොදු පහසුකම් ලබාදීම, වෙළෙඳපොළ අරමුණු කරගත් නිර්මාණාත්මක මෝස්තර හඳුන්වාදීම, නිර්මාණාත්මක කුසලතා සංවර්ධනය සහ අමුද්‍රව්‍ය හා

මූලික උපකරණ ලබාදීම සඳහා කටයුතු කරන ලදී. දීපව්‍යාප්තව හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 68 ක සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධනය කිරීමට මෙමගින් හැකි විය.

| සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත සංවර්ධන ක්ෂේත්‍ර | | | |
|---|---|---|---|
| පන් ආශ්‍රිත අත්කම් භාණ්ඩ | මැටි භාණ්ඩ නිෂ්පාදනය | කම්මල් භාණ්ඩ නිෂ්පාදනය | රන් භාණ්ඩ හා හණ නිෂ්පාදන ගම්මාන |
| තල් කොළ ආශ්‍රිත අත්කම් භාණ්ඩ | ලී ආශ්‍රිත අත්කම් භාණ්ඩ නිෂ්පාදනය | ඉඳි කොළ ආශ්‍රිත නිෂ්පාදන | ලාක්ෂා භාණ්ඩ නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථාන |
| හණ කෙඳි ආශ්‍රිත නිෂ්පාදන | කිතුල් රැහැන් ආශ්‍රිත නිෂ්පාදන | ස්වර්ණාභරණ | වේවැල් ආශ්‍රිත නිෂ්පාදන |
| කළුගල් ආශ්‍රිත නිෂ්පාදන | පුවක් ආශ්‍රිත අත්කම් | බට ආශ්‍රිත නිෂ්පාදන | |





ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන්ගේ ප්‍රධානත්වයෙන් කෝරළෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති භාණ්ඩ බෙදාදීමේ අවස්ථාව සහ එහි පවත්වන ලද පුහුණු වැඩසටහන

## 9.13. හස්ත කර්මාන්ත ගම්මාන වැඩිදියුණු කිරීම

හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත ශිල්පීන් සඳහා තාක්ෂණික දැනුම හා කළමනාකරණ පුහුණුව ලබාදීම, මූලික උපකරණ ලබාදීම මඟින් ශිල්පීන් ශක්තිමත් කිරීම සහ ඔවුන්ගේ නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ අවස්ථා පුළුල් කිරීම ඉලක්ක කරගනිමින් හස්ත කර්මාන්ත ගම්මාන වැඩිදියුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. මේ සඳහා දේශීය අරමුදලින් රුපියල් මිලියන 6 ක ප්‍රතිපාදන 2016 වසරට ලබා දී ඇත. මෙම වැඩසටහන යටතේ, තෝරාගත් දිස්ත්‍රික්ක 12 ක හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලි කර්මාන්තකරුවන් සංවර්ධනය කිරීම සඳහා පහත සඳහන් පරිදි කටයුතු කර ඇත.

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ගම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ව්‍යාපෘතියේ නම | මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| අනුරාධපුර | හොරොව්පතාන | ප්‍රා. ලේ. කොට්ඨාශය තුළ | 15 | හස්ත කර්මාන්ත | 0.63 | 0.55 |
| කෑගල්ල | දැරණියගල | අංහෙට්ටිගම | 30 | වූල් අත්කම් ගම්මානය | 0.12 | 0.12 |
| | මාවනැල්ල | පාට්ටගම | 12 | මැටි කර්මාන්තය | 0.51 | 0.51 |
| කිලිනොච්චිය | කඩ්ඩවලායි | ප්‍රා. ලේ. කොට්ඨාශය තුළ | 30 | තල් ආශ්‍රිත නිෂ්පාදන | 0.33 | 0.32 |
| කුරුණෑගල | පඬුවස්නුවර | රඹෑපිටිය මහලාගම | 30 | වේවැල් ආශ්‍රිත අත්කම් භාණ්ඩ | 0.12 | 0.12 |
| | අලව්ව | ඉහළ කලල්පිටිය | 30 | තල් කොළ ආශ්‍රිත නිෂ්පාදන | 0.20 | 0.20 |
| | මල්ලවපිටිය | කෝරලේ ගෙදර | 18 | බෙර නිෂ්පාදනය | 0.10 | 0.10 |
| | නාරම්මල | රුක්මලේ | 16 | මැටි කර්මාන්තය | 0.70 | 0.70 |
| ගාල්ල | බද්දේගම | ගිණිමැල්ලගහ | 25 | උණ බට, ඉරටු, වේවැල් ආශ්‍රිත අත්කම් භාණ්ඩ නිෂ්පාදනය | 0.53 | 0.52 |
| ත්‍රිකුණාමලය | තම්පලගමම | පත්තිනිපුර | 25 | තල් ආශ්‍රිත අත්කම් භාණ්ඩ නිෂ්පාදනය | 0.27 | 0.27 |
| | වෙරුගල් | ප්‍රා. ලේ. කොට්ඨාශය තුළ | 30 | තල් ආශ්‍රිත නිෂ්පාදන | 0.15 | 0.15 |
| පුත්තලම | ආරච්චිකට්ටුව | - | 10 | මැටි කර්මාන්තය | 0.43 | 0.43 |
| මඩකලපුව | කෝරළෙයිපත්තු | කිරණ | 30 | තල් ආශ්‍රිත අත්කම් භාණ්ඩ නිෂ්පාදනය | 0.22 | 0.22 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මොනරාගල | මැදගම | කෝන්ගොල්ල | 15 | වේවැල් ආශ්‍රිත අත්කම් භාණ්ඩ නිෂ්පාදනය | 0.53 | 0.53 |
| යාපනය | කෝපායි | නීර්වෙලි | 25 | කෙසෙල් කෙඳි ආශ්‍රිත නිෂ්පාදන | 0.47 | 0.47 |
| රත්නපුර | ඕපනායක | මිදෙල්ලගොඩ වරාකැටිය | 25 | පොල් කටු ආශ්‍රිත අත්කම් භාණ්ඩ නිෂ්පාදනය | 0.40 | 0.40 |
| හම්බන්තොට | බෙලිඅත්ත | කොස්ගහගොඩ | 50 | කොහු ආශ්‍රිත අත්කම් භාණ්ඩ නිෂ්පාදනය | 0.19 | 0.19 |
| එකතුව | | | **416** | | **5.90** | **5.80** |

## 9.14. මැටි නිෂ්පාදන ගම්මාන සංවර්ධනය කිරීම

ග්‍රාමීය මැටි කර්මාන්ත නිෂ්පාදන ක්ෂේත්‍රයේ නිරත කාර්මිකයින් සඳහා නව තාක්ෂණය ලබාදීම තුළින් ගුණාත්මකභාවයෙන් උසස් නිෂ්පාදන බිහිකිරීම, වෙළෙඳපොළ ඉල්ලුමක් පවතින අත්කම් භාණ්ඩ නිෂ්පාදනය කෙරෙහි යොමු කරවීම, කුසලතා වර්ධනය කිරීම හා නවීන උපකරණ හඳුන්වාදීම යන අරමුණු පෙරදැරිව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. 2016 වර්ෂයේදී රුපියල් මිලියන 5 ක ප්‍රතිපාදන දේශීය අරමුදලින් ලබා දෙන ලදී. මේ යටතේ අනුරාධපුරය, කෑගල්ල, බදුල්ල, මාතර සහ කළුතර යන දිස්ත්‍රික්කයන්හි තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පහත සඳහන් පරිදි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

| | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාශය | ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ගම / ගම් | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | මුළු ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|---|---|
| 1 | අනුරාධපුර | තිරප්පනේ | පණ්ඩිත් රඹෑව | 35 | 0.93 | 0.90 |
| 2 | | තඹුත්තේගම | මැහිඇල්ලෑව ගම | 38 | 0.74 | 0.74 |
| 3 | | මිහින්තලය | කටුපොත | 25 | 0.27 | 0.27 |
| 4 | | නොච්චියාගම | කඳුවැව | 25 | 0.88 | 0.88 |
| 5 | | කැබිතිගොල්ලෑව | කුරුලු ගම | 20 | 0.18 | 0.18 |
| උප එකතුව | | | | **123** | **3.00** | **2.97** |
| 6 | කුරුණෑගල | මහව | හීනුග්ගල | 40 | 0.62 | 0.62 |
| 7 | | ඉබ්බාගමුව | වගුර/ගල්ලිඳකොටුව | 25 | 0.31 | 0.31 |
| 8 | | ගනේවත්ත | තිත්තවැල්ල | 20 | 0.02 | 0.02 |
| උප එකතුව | | | | **65** | **0.95** | **0.95** |
| 9 | බදුල්ල | හල්දුම්මුල්ල | නිකපොත/විහාරගල | 21 | 0.48 | 0.48 |
| උප එකතුව | | | | **21** | **0.48** | **0.48** |
| 10 | මාතර | කිරින්ද පුහුල්වැල්ල | වවුලබොක්ක | 25 | 0.20 | 0.20 |
| උප එකතුව | | | | **25** | **0.20** | **0.20** |
| 11 | කළුතර | කළුතර | දියගම/දොඩම්මුල්ල | 25 | 0.21 | 0.08 |
| උප එකතුව | | | | **25** | **0.21** | **0.08** |
| එකතුව | | | | **259** | **4.84** | **4.68** |




*ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ ගරු අමාත්‍යතුමන් විසින් නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැටි කර්මාන්තකරුවන් සඳහා භාණ්ඩ ලබාදීමේ අවස්ථාව*

## 9.15. ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන (2016-2020)

ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය නඟා සිටුවීම සඳහා ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ග්‍රාමීය යටිතල පහසුකම් හා කුඩා ව්‍යවසාය සංවර්ධනය ආදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධන වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ.

මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා 2016 සිට 2020 දක්වා කාලය තුළ දේශීය අරමුදල් යොදා ගෙන දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක වල ග්‍රාමීය ප්‍රදේශ ආවරණය වන පරිදි ග්‍රාමීය යටිතල පහසුකම් හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

මෙම වැඩසටහන නියමු ව්‍යාපෘතියක් ලෙස 2016 වර්ෂයේ අගෝස්තු මස සිට දෙසැම්බර් මස දක්වා රු.මි. 300 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන මත අනුරාධපුර, පොළොන්නරුව හා මඩකලපුව දිස්ත්‍රික්ක 03 සඳහා ක්‍රියාත්මක කරන ලදී. එම දිස්ත්‍රික්කයන්හි පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ප්‍රමාණය සැලකිල්ලට ගෙන අනුරාධපුරය,මඩකලපුව හා පොළොන්නරුව දිස්ත්‍රික්ක වලට පිළිවෙළින් රු. මිලියන 170 ක්ද රු. මිලියන 100 ක් හා රු. මිලියන 30 ක් ද වන සේ එම ප්‍රතිපාදන වෙන් කරන ලදී.

ඒ ඒ දිස්ත්‍රික්ක වල පවත්නා සම්පත් විෂමතාවය හා ග්‍රාමීය ප්‍රජාවගේ ඉල්ලීම පරිදි හඳුනාගත් ව්‍යාපෘති දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අධීක්ෂණය හා මඟපෙන්වීම යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී.

| මූල්‍ය හා භෞතික ප්‍රගතිය - ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන - 2016 | | | | | | |
|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික්කය | ව්‍යාපෘතියේ නම | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.) | ප්‍රගතිය | | ඉතිරි ප්‍රතිපාදන (රු.මි.) | වෙනත් කරුණු |
| | | | මූල්‍ය (රු.මි.) | භෞතික | | |
| අනුරාධපුර | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය | 62.9 | 51.50 | 84% | 11.07 | අනුමත ව්‍යාපෘති 184න් 159ක් නිම කර ඇත. |
| | කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම | 0.75 | 0.75 | 100% | - | කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන 02 ක් නවීකරණය කර ඇත. (අනුරාධපුරය හා කහටගස්දිගිලිය කිරි ශීතකිරීමේ මධ්‍යස්ථාන 02) |
| | කිරි ගවයින් 250 ක් ගොවීන් වෙත ලබා දීම | 29.25 | 3.09 | 45% | 26.16 | කිරි ගවයින් 113 ක් ගොවින් ට බෙදා දී ඇත. |
| | බඩ ඉරිඟු අක්කර 5000 ක් වගා කිරීම සඳහා ගොවීන් 5000කට බඩ ඉරිගු බෝග ලබා දීම | 27.1 | 27.1 | 100% | - | බඩ ඉරිඟු බීජ ගොවීන් 5020 ක් වෙත ලබා දී ඇත. |
| | ප්‍රධාන වැව් ආශ්‍රිතව ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර කාර්මිකයින් 1000 සඳහා දැල් ඇතුළු සුළුපන්න ධීවර ආම්පන්න ලබාදීම | 10 | 9.89 | 100% | 0.11 | උපකරණ බෙදා දී ඇත. |
| | ප්‍රධාන මාර්ග ආශ්‍රිතව අවිධිමත් වෙළෙඳාමෙහි නියුතුවූවන් 163 සඳහා ජංගම අළෙවිසැල් ලබාදීම | 15 | 15.73 | 100% | -0.73 | ජංගම අලෙවිසැල් බෙදා දී ඇත. |
| | විශේෂ ව්‍යාපෘති - කෘෂි භෝග වගා කරන ගොවීන් 750 දෙනෙකුට වතුර පොම්ප 750ක් ලබාදීම | 25 | 24.29 | 100% | 0.71 | උපකරණ බෙදා දී ඇත. |
| | **එකතුව** | **170** | **132.35** | **80%** | **37.65** | |
| **මඩකලපුව** | පානීය ජල ව්‍යාපෘති, මාර්ග සංවර්ධනය, කානු පද්ධති සකස් කිරීම | 100 | 97.3 | 100% | **2.7** | අනුමත ව්‍යාපෘති 110 නිම කර ඇත.<br>(යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති - 44 ක් හා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති - 66 ක් නිම කර ඇත) |
| | සුළුපන්න ධීවර ආම්පන්න ලබාදීම, මහන මැෂින් හා ස්වයං රැකියා සඳහා උපකරණ ලබා දීම | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **පොළොන්නරුව** | කුඩා බෝක්කු, ග්‍රාමීය මාර්ග සංවර්ධනය, කාණු පද්ධති සකස් කිරීම | 30 | 24.24 | 96% | **5.67** | අනුමත ව්‍යාපෘති 55න් 53ක් නිම කර ඇත.<br>අතැති බිල් රු. 4,518,000 |
| | කුකුළු පාලන ව්‍යාපෘති, කෘෂි ආම්පන්න ලබාදීමේ ව්‍යාපෘති හා ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා | | | | | |
| **මුළු එකතුව** | | **300** | **253.98** | **85%** | **46.02** | |





*ගරු අමාත්‍යතුමා විසින් ගලෙන්බිඳුනුවැව, තිරප්පනේ හා නාච්චිදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල බඩඉරිඟු ගොවීන්ට බඩඉරිඟු බීජ බෙදා දෙමින්*



*ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන් විසින් පලෙයි නගර් මාර්ගය විවෘත කිරීම*



*ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමන් විසින් අර්ෆා නගර්හි පානීය ජල ව්‍යාපෘතිය ජනතා අයිතියට පත්කරමින්*

## 9.16. උතුරු පළාතේ විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම

වවුනියාව දිස්ත්‍රික්කයේ මාතවුවෛතකුලම් ප්‍රදේශය ආශ්‍රිතව සහ මුලතිව් දිස්ත්‍රික්කයේ මාන්කුලම් නගරය ආශ්‍රිතව විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. මේ යටතේ 2016 වර්ෂය සඳහා රු.මි. 200 ක ප්‍රතිපාදන වෙන් වී ඇත. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් වවුනියාව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතී.

# 10. 2016 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

## 10.1. දේශීය කිරි නිෂ්පාදකයන් වෙත ප්‍රතිපූර්ණ ප්‍රදානයන් ලබා දීම

දේශීය කිරි නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා ඔවුන් දිරිමත් කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුගතවෙමින් දේශීයව නිෂ්පාදනය කරනු ලබන ග්‍රෑම් 400 කිරි පිටි පැකට්ටුවක් සඳහා වන උපරිම සිල්ලර මිල රු. 325 සිට රු. 295 දක්වා අඩු කිරීමට 2016 අය වැය යෝජනාවක් මඟින් තීරණය කර ඇත. ඒ අනුව, ග්‍රාමීයව අලෙවි කරනු ලබන සෑම ග්‍රෑම් 400 කිරි පිටි පැකට්ටුවකටම රජය විසින් රු. 30 ක සහනාධාර මුදලක් දේශීය කිරි නිෂ්පාදකයන් වෙත ලබා දීමට රු.මිලියන 1,000 ක් වෙන් කර ඇත. ඒ අනුව ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ නිර්දේශය මත 2016 දෙසැම්බර් මස අවසන් වන විට, සී/ස පැල්වත්ත කිරි නිෂ්පාදන සමාගම වෙත රු.මිලියන 216.69 ක් සහ මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත රු. මිලියන 218.69 ක ප්‍රතිපූර්ණ ප්‍රදානයන් ලබා දී ඇත.

## 10.2. දේශීය කුකුළු ගොවිපොළ නිෂ්පාදන සඳහා විදේශීය වෙළෙඳපොළ අවස්ථා සොයා බැලීම

මේ සඳහා වන මූලික සාකච්ඡාව විශේෂ කාර්යභාර අමාත්‍යාංශයෙහි සහභාගීත්වයෙන් පැවති අතර, දේශීය කුකුළු ගොවිපළ කර්මාන්තයෙහි වර්තමාන තත්ත්වය සහ එම නිෂ්පාදන විදේශ වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමේ හැකියාවන් පිළිබඳ විශ්ලේෂණාත්මක වාර්තාවන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා ශ්‍රීලංකා කුකුළු ගොවිපළ නිෂ්පාදකයින්ගේ එකමුතුව මඟින් ඉදිරිපත් කිරීමට නියමිතය. තවද විදේශ වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් වයඹ පළාත තුළ කුකුළු ගොවිපළ ඒකරාශීගත මධ්‍යස්ථානයක් ඇති කිරීමේ හැකියාව සොයා බැලීමට යෝජනාවී ඇත.

## 10.3 ශීතාගාර ස්ථාපිත කිරීම

නුවරඑළිය, දඹුල්ල, ඇඹිලිපිටිය, කැප්පෙටිපොළ හා තඹුත්තේගම පිහිටි විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයන්ට ආසන්නයේ එළවළු හා පලතුරු ගබඩා කිරීම සඳහා පෞද්ගලික අංශය විසින් කළමනාකරණය කරනු ලබන ශිතාගාර 05 ක් පිහිටුවීමට 2016 අයවැය මඟින් යෝජනා කරන ලදී. මෙහි අරමුණ වූයේ වෙළෙඳපොළ මිල ස්ථායීකරණය හා පසු අස්වනු හානිය අවම කිරීමයි.

ඒ අනුව, යෝජිත ශීතාගාර 05 වෙනුවට බී ළූණු ප්‍රමුඛව තෝරාගත් එළවළු සහ පලතුරු වර්ග කිහිපයක් සඳහා දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය හා අර්තාපල් ප්‍රමුඛව තෝරාගත් එළවළු සහ පලතුරු වර්ග කිහිපයක් සඳහා කැප්පෙටිපොළ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය කේන්ද්‍රකොට ගනිමින් නියමු ව්‍යාපෘතියක් වශයෙන් ශීතාගාර 02 ක් ඉදිකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය ආසන්නයේ ඇති නාගරික සංවර්ධන අධිකාරියට අයත් අක්කර 01 රූඩ් 0 පර්චස් 27.93 ක භූමි ප්‍රදේශයක් අදාළ ශීතාගාරය ඉදිකිරීම සඳහා ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයට පවරා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. කැප්පෙටිපොළ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය කේන්ද්‍රකොට ගනිමින් ඉදිකරනු ලබන ශීතාගාරය සඳහා එම ආර්ථික මධ්‍යස්ථාන භූමියේ අක්කරයක භූමි ප්‍රදේශයක් යොදා ගෙන ඇත. රාජ්‍ය හා

පෞද්ගලික අංශ සහ විශ්ව විද්‍යාලවල විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් ශීතාගාර ස්ථාපනය කිරීම සඳහා සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යනයක් සිදු කරන ලදී.

සමාලෝචිත කාලසීමාව වන විට මෙම ශීතාගාර 02 ඉදිකිරීම සඳහා උපදේශන ආයතනයක් තෝරා ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී. අදාළ ප්‍රසම්පාදන කටයුතු නිමකිරීමෙන් පසු ශීතාගාර ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නියමිතය.

## 10.4 උතුරු පළාතේ විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම

කෘෂි අලෙවි සංවර්ධන උපාය මාර්ගයක් ලෙස උතුරු පළාතේ වවුනියාව දිස්ත්‍රික්කයේ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2016 අයවැය යෝජනා අනුව රුපියල් මිලියන 200 ක් වෙන් කරන ලදී. යෝජිත විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා සුදුසු ඉඩමක් වවුනියාව නගරය ආශ්‍රිතව තෝරා ගැනීමේ අපහසුතාවය පිළිබඳව ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවට ඉදිරිපත් කරන ලදුව, මුලතිව් දිස්ත්‍රික්කයේ මාන්කුලම් නගරයේ සහ වවුනියාව නගරයට ආසන්නව හෝ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය විසින් නිශ්චය කරන ස්ථානයක සුදුසු ඉඩම් හඳුනාගෙන විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන 02 ක් ඉදිකරන ලෙස යෝජනා කරන ලදී.

ඒ අනුව, මුලතිව් දිස්ත්‍රික්කයේ මාන්කුලම් නගරය ආශ්‍රිතව සහ වවුනියාව දිස්ත්‍රික්කයේ මාතවුවෛතකුලම් ප්‍රදේශය ආශ්‍රිතව විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීම අදියර දෙකක් යටතේ නිම කිරීමට අපේක්ෂිත අතර, එක් මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා රුපියල් මිලියන 200 ක මුදලක් ආයෝජනය කෙරේ. මෙම ආර්ථික මධ්‍යස්ථාන 02 ඉදිකිරීම සඳහා සුදුසු ඉඩම් හඳුනාගැනීමට කටයුතු කරන ලද අතර අදාළ ඉඩම් මෙම අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. වවුනියාව විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය ඉදිකිරීමට යෝජිත වවුනියාව මාතවුවෛතකුලම් ප්‍රදේශයේ පිහිටි ඉඩම මෙම අමාත්‍යාංශය වෙත පවරා ගැනීම සඳහා 2016.09.27 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු අතර, ඒ අනුව එම ඉඩම විධිමත් ලෙස පවරා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. තවද, විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ඉදිකිරීම සම්බන්ධ සවිස්තරාත්මක සැලසුම් හා ඇස්තමේන්තු අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය වෙත දන්වා ඇත.

## 11. 2016 වසර තුළදී ලබා ගත් විශේෂ ජයග්‍රහණ

- **රජරට නවෝදය - ජනපති වැඩසටහන (2016 - 2020)**
  **කෘෂි පාදක කර්මාන්ත සහ කෘෂි නිෂ්පාදන අලෙවි යටිතල පහසුකම් ප්‍රවර්ධන ව්‍යාපෘතිය**

"පිබිදෙමු පොළොන්නරුව" බහු ආංශික සංවර්ධන වැඩසටහනට ඇතුළත් ක්ෂේත්‍රයන් අතරින් කෘෂි අලෙවිදාම ස්ථාපිත කිරීම හා කෘෂි ආර්ථික වෙළෙඳ මධ්‍යස්ථානයක් ඉදිකිරීම රජරට නවෝදය-ජනපති වැඩසටහන යටතේ නිර්දේශිත ප්‍රධාන හා ප්‍රමුඛ අවශ්‍යතාවයන්ගෙන් එකකි. මේ යටතේ, කෘෂි පාදක කර්මාන්ත සහ කෘෂි නිෂ්පාදන අලෙවි යටිතල පහසුකම් ප්‍රවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන චීන රජයේ අනුග්‍රාහක මූල්‍ය පහසුකම් යටතේ සලසා දීමට එකඟ වී ඇත.

මෙම ව්‍යාපෘතියේ කටයුතු සිදු කිරීම සඳහා චීනයේ සිනෝහයිඩ්රෝ සමාගම (Sinohydro Corporation Ltd) හා සම්බන්ධීකරණය වී අප අමාත්‍යාංශය කටයුතු කරයි. ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය සහ අදාළ පාර්ශවකරුවන්ගේ යෝජනා සැලකිල්ලට ගනිමින් පහත සඳහන් උප ව්‍යාපෘතීන් හඳුනාගෙන ඇත.

- කදුරුවෙල කෘෂි ආර්ථික වෙළෙඳ මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම
- පොළොන්නරුව හා අනුරාධපුර දිස්ත්‍රික්කයන්හි සතිපොළ 15ක් සංවර්ධනය කිරීම
- තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය නවීකරණය කිරීම
- මෙ.ටොන් 3,000 බැගින් වූ ධාරිතාවයෙන් යුත් වී ගබඩා 07ක් පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ස්ථාපිත කිරීම
- දෛනික ධාරිතාවය මෙ.ටොන් 100ක් වන වී මෝලක් සහ මෙ.ටොන් 10,000 ක ධාරිතාවයෙන් යුත් වී ගබඩාවක් අනුරාධපුර ඔයාමඩුවේ ස්ථාපිත කිරීම
- ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් පොළොන්නරුව, වැලිකන්ද, කන්දෙකඩුව, ත්‍රිකෝණමඩුව, ඔයාමඩුව, පරසන්ගස්වැව යන ස්ථානවල නව කිරි ගොවිපොළවල් ස්ථාපිත කිරීම
- තඹුත්තේගම මහවැලි සත්ත්ව ව්‍යාපාරික ගොවිපොළෙහි සහ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් සීප්පුකුලම සත්ත්ව පාලන පුහුණු විදුහලේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය සහ අදාළ පාර්ශවකරුවන්ගේ යෝජනා සැලකිල්ලට ගෙන සිනෝහයිඩ්රෝ සමාගම විසින් උක්ත ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන සහ පාරිසරික වාර්තාවන් ලබා දෙන ලදී. උක්ත ව්‍යාපෘතිය 2017-2020 කාලය තුළ නිම කිරීමට හැකිවන ලෙස කඩිනමින් ආරම්භ කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2016.10.25 දින ලැබී ඇත. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ කොන්ත්‍රාත්තුව ඇමරිකානු ඩොලර් මිලියන 234.46 ක මුදලකට චීනයේ සිනෝහයිඩ්රෝ සමාගම වෙත පිරිනැමීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිත සැපයුම් කොන්ත්‍රාත්තු ගිවිසුම 2016 නොවැම්බර් මස 17 වන දින අත්සන් කරන ලදී.



*චීනයේ සිනෝහයිඩ්රෝ සමාගම සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය ව්‍යාපෘතියේ සැපයුම් කොන්ත්‍රාත්තු ගිවිසුමට අත්සන් තැබූ අවස්ථාව*

## ❖ Farm IQ දත්ත සංචිතය ස්ථාපනය කිරීම

ශ්‍රී ලංකාවේ කිරි ගව පාලනයට අදාළ වැදගත් දත්ත හා තොරතුරු රැස්කිරීම හා යාවත්කාලීනව පවත්වාගැනීම සඳහා **Farm IQ** දත්ත සංචිතය ස්ථාපනය කිරීමට නවසීලන්ත රජයේ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය හා අප අමාත්‍යාංශය අතර 2016 නොවැම්බර් මස 04 වන දින මූලික එකඟතාවයකට එළඹිණි. දිවයිනේ සියලුම කිරි ගොවිපොළවල නිෂ්පාදන, සත්ත්ව සෞඛ්‍යය, අභිජනනය හා සත්ත්ව ආහාර වලට අදාළ දත්ත හා තොරතුරු ජාලගත කිරීමට අපේක්ෂිත අතර, මෙහි පූර්ව නියමු ව්‍යාපෘතිය 2016 නොවැම්බර් මස අගදී ඇරඹීමට නියමිතය.

## ❖ ශ්‍රී ලාංකීය කිරි නිෂ්පාදන විශිෂ්ටත්ව පුහුණු ප්‍රවේශය සඳහා වන හවුල්කාරීත්ව එකඟතාවය

ශ්‍රී ලාංකීය කිරි නිෂ්පාදන විශිෂ්ටත්ව පුහුණු ප්‍රවේශය සඳහා වන හවුල්කාරීත්ව එකඟතා ගිවිසුමට අත්සන් තැබීම නවසීලන්ත අග්‍රාමාත්‍යතුමාගේ ශ්‍රී ලංකා සංචාරය තුළදී සිදුවූ අතර, මේ සඳහා පාර්ශවකරුවන් වශයෙන් නවසීලන්ත රජයේ විදේශ සහ වෙළඳ කටයුතු අමාත්‍යාංශය හා ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය සහභාගී විය.

මේ යටතේ, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් කිරි ගොවීන් වෙත සපයන ව්‍යාප්ති සේවාවන්හි ගුණාත්මකභාවය හා ධාරිතාවය ඉහළ නැංවීම සඳහා දායකත්වය ලබාදීමට නවසීලන්ත රජයේ එකඟතාවය පලවිය.

- ❖ **නව පනත් කෙටුම්පත් සම්පාදනය හා පනත් සංශෝධන**

  - ➢ **සත්ත්ව සුභසාධනය සම්බන්ධ නව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම**

සත්ත්ව සුභසාධනය සම්බන්ධයෙන් දැනට පවතින 1907 වසරේ සම්පාදිත සත්ත්ව හිංසනය වැළැක්වීමේ ආඥා පනත වෙනුවට නව පනත් කෙටුම්පතක් සකස්කර අවශ්‍ය සංශෝධන සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

  - ➢ **1958 අංක 29 දරණ සත්ත්ව පනත සංශෝධනය**

සතුන්ගේ යහපැවැත්ම ආරක්ෂා කිරීමට දැනටමත් පවත්නා නීති ක්‍රියාත්මක කිරීම හා බලගැන්වීම සඳහා 1958 අංක 29 දරණ සත්ත්ව පනත සංකල්ප පත්‍රයක් මත පදනම්ව අවශ්‍ය සංශෝධන සකස් කිරීමට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

  - ➢ **1986 අංක 15 දරණ සත්ත්ව ආහාර පනත සංශෝධනය**

1986 අංක 15 දරණ සත්ත්ව ආහාර පනතට නව සංශෝධන ඇතුළත් කරමින් 2016 අංක 15 දරණ සත්ත්ව ආහාර (සංශෝධන) පනත ගැසට් කරන ලදී.

- ❖ **"නිල මෙහෙවර ජංගම සේවය" - පොළොන්නරුව දිස්ත්‍රික්කය (2016 ජූලි)**

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පශු සම්පත් ක්ෂේත්‍රයෙහි නිරත ගොවීන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය යෙදවුම් හා තාක්ෂණික දැනුම ලබාදීමේ අරමුණ පෙරදැරිව "නිල මෙහෙවර ජංගම සේවය" යටතේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අප අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති අදාළ ආයතන දැක්වූ දායකත්වය සැකෙවින් පහත දක්වා ඇත.

| |
|---|
| *ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය* |
| ➢ *ගොවීන් 117 ක් වෙත ගම් කුකුළු පැටවුන් 1,170 දෙනෙකු ලබාදීම* |
| *උතුරු මැද පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව* |
| ➢ *ප්‍රතිලාභී ගොවිපොළ 15 ක් වෙත එළුවියන් 30 ක් නිකුත් කිරීම* |
| *මිල්කො (ප්‍රයිවට්) ලිමිටඩ්* |
| ➢ *ප්‍රතිලාභී කිරි ගොවිපොළ 42 ක් වෙත සියයට 50 ක ප්‍රතිලාභී දායකත්වය යටතේ උසස් ආරයේ වැස්සි පැටවුන් 42 ක් ලබාදීම*<br>➢ *ලීටර් 5 බැගින් වූ ධාරිතාවයෙන් යුතු ඇලුමිනියම් කිරි බඳුන් 170 ක් ගොවීන් 170 දෙනෙකු වෙත බෙදාදීම*<br>➢ *කිරි ගොවීන්ට හැඳුනුම්පත් ලබාදීම*<br>➢ *ලීටර් 500 බැගින් වූ ධාරිතාවයෙන් යුතු කුඩා පරිමාණ කිරි ශීත ටැංකි දෙහිඅත්තකණ්ඩිය හා කටුවන්විල ස්ථානවල ස්ථාපිත කිරීම* |

ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය

கிராமிய பொருளாதார அலுவல்கள் அமைச்சு

# Ministry of Rural Economy


නො.492, ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 03.

இல492, ஆர்.ஏ.டீ மெல் மாவத்தை, கொழும்பு 03

**No.492, R.A. De Mel Mawatha, Colombo 03.**

Phone : +94112556537 / +94112556723/+94112556724
Fax : +94112556530 / +94112556486
Email : secretary@reco.gov.lk